නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ යම් සේනාවකට හෝ හමුදා ගවේශණයකට හෝ නායකයකු පත් කළ විට ඔහුට සහ ඔහු සමග යන මුස්ලිම්වරුනට යහපත් අයුරින් අල්ලාහ් පිළිබඳ මතකයෙන් පසුවන මෙන් උපදෙස් දෙන්නෙකු වූහ.

බුරෙයිදා ඉබ්නු අල්-හුසෙයිබ් අල් අස්ලමී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ යම් සේනාවකට හෝ හමුදා ගවේශණයකට හෝ නායකයකු පත් කළ විට, ඔහුට සහ ඔහු සමග යන මුස්ලිම්වරුනට යහපත් අයුරින් කටයුතු
කරන මෙන් ද අල්ලාහ් පිළිබඳ මතකයෙන් පසුවන මෙන් ද උපදෙස් දෙන්නෙකු වූහ. එවිට එතුමා මෙසේ පවසයි: “අල්ලාහ්ගේ නාමය පවසා අල්ලාහ්ගේ මාර්ගයේ යුද වදින්න. අල්ලාහ්ව ප්රතික්ෂේප කොට ද්රෝහිකම් කළවුන් සමග සටන් වදින්න. නුඹලා (යුද්ධයෙන් අත්පත් කරගන්නා දෑහි) වංචා නොකරන්න. (සතුරන්ගේ දේහ) විකෘති නොකරන්න. (වැඩිවියට පත් නොවූ) දරුවන් මරා නොදමන්න. ඔබ දේව ආදේශකයින් අතරින් ඔබේ සතුරකු ඔබ මුණ ගැසුණු විට කරුණු තුනක් වෙත ඔවුන්ව ඇරයුම් කරන්න. ඒ කවර හෝ දෙයකට ඔවුහු නුඹලාට පිළිතුරු දුන්නේ නම් ඔබ ඔවුන්ව පිළිගෙන ඔවුන් (සමග සටන් කිරීමෙන්) වළක්වා ගන්න. පසුව ඉස්ලාමය වෙත ඔවුන් ඇරයුම් කරන්න. එවිට ඔවුහු නුඹට අවනත වූයේ නම් ඔවුන්ව පිළිගන්න. පසුව ඔවුන්ගෙන් නිවහනින් මුහාජිර්වරුන් හෙවත් (නික්ම ගියවුන්ගේ) නිවහන වෙත හැරෙන්නට ඔවුන්ට ඇරයුම් කරන්න. සැබැවින්ම ඔවුන් එය සිදු කළේ නම් මුහාජිර්වරුන්ට සතු දෑ ඔවුනට ඇති බවත් මුහාජිරීන් වරුන් මත කවර කරුණක් පවතින්නේ ද එය ඔවුන් මත ද පවතින බවත් ඔවුනට දන්වන්න. නමුත් ඔවුන් ඉන් හැරීමට ප්රතික්ෂේප කළේ නම් එවිට උත්තරීතර අල්ලාහ්ගේ නීතිය ක්රියාත්මක වන ගම්බද අරාබි මුස්ලිම්වරුන් සේ ඔවුහු පත්වනු ඇත. මුස්ලිම්වරුන් සමග එක්ව ඔවුන් අරගල කිරීමෙන් තොරව සතුරා විසින් යුද පිටියේ හැර දමා ගිය වස්තුවෙහි ඔවුනට කිසිවක් නොවනු ඇත. ඔවුන් එය ප්රතික්ෂේප කළේ නම් ඔවුන්ගෙන් බදු ඉල්ලා සිටින්න. ඔවුහු ඔබට පිළිතුරු දුන්නේ නම් ඔබ ඔවුන් පිළිගනු. ඔවුන්ගෙන් වැළකී සිටිනු. එය ද ඔවුන් ප්රතික්ෂේප කළේ නම් අල්ලාහ්ගෙන් උදව් පතා ඔවුන් සමග සටන් කරනු. යම් බලකොටුවක ජනයා නුඹ කොටුකර ගත් විට අල්ලාහ්ගේ ආරක්ෂාව හා ඔහුගේ නබිවරයාගේ ආරක්ෂාව ඔවුන් වෙනුවෙන් ඔබ පත් කිරීම සඳහා ඔවුහු ඔබට යෝජනා කළේ නම්, ඔබ ඔවුන් වෙනුවෙන් අල්ලාහ්ගේ ආරක්ෂාව හා ඔහුගේ නබිවරයාගේ ආරක්ෂාව ඔවුනට පත් නොකර, ඔබේ ආරක්ෂාව හා ඔබේ මිතුරන්ගේ ආරක්ෂාව ඔවුනට පත් කරන්න. සැබැවින්ම නුඹලා නුඹලාගේ ආරක්ෂාව හා නුඹලාගේ මිතුරන්ගේ ආරක්ෂාව ගැන ප්රතිඥාව කඩ කිරීම අල්ලාහ්ගේ ආරක්ෂාව හා ඔහුගේ නබිවරයාගේ ආරක්ෂාව ගැන ප්රතිඥාව කඩ කිරීමට
වඩා සැහැල්ලුය. බලකොටු වාසීන්ව නුඹ කොටු කරගත් විට අල්ලාහ්ගේ නීතිය මත ඔබ ඔවුන් බැස්ස වීම සඳහා ඔවුහු නුඹලාට යෝජනා කළේ නම් නුඹලා එසේ ඔවුන්ව නොබස්සවනු. නමුත් නුඹේ නීතිය මත ඔවුන්ව නුඹ බස්සවනු. ඊට හේතුව සැබැවින් ඔවුන් අතර අල්ලාහ්ගේ නීතිය ඔබට ක්රියාත්මක කිරීමට හැකි ද නොහැකිද යන්න ඔබ නොදන්නා බැවිණි. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

බුරෙයිදා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ ප්රකාශ කර සිටියි. සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) යම් භට පිරිසක් හෝ ගවේෂණ කණ්ඩායමක් හෝ

http://sunnah.global/hadeeth/si/show/5933